## 12 ශ්‍රේණිය ව්‍යාපාර අධ්‍යයනය

## නිපුණතා මට්ටම 11.4 - විදේශ වෙළෙඳාම හා ඒ ආශ්‍රිත ප්‍රතිලාභ හා බාධක විමසයි.

යම් රටක් වෙනත් හෝ රටවල් සමඟ සිදු කරන වෙළෙඳාම විදේශ වෙළෙඳාම වේ.

### විදේශ වෙළෙඳාම සඳහා පදනම් වී ඇති සාධක

1.ස්වාභාවික සම්පත් බෙදී යාමේ විෂමතාවය

2.සාපේක්ෂ පිරිවැය වාසිය

3.සමහර නිෂ්පාදිත සම්බන්ධ ව සමහර රටවල නීතිමය ඒකාධිකාරයක් තිබීම.

4.භාණ්ඩ ප්‍රවර්ධනය

5.වෙළෙඳ බාධක අවම වීම

### විදේශ වෙළෙඳාමේ ප්‍රභේද

1.ආනයන වෙළෙඳාම

2.අපනයන වෙළෙඳාම

3.ප්‍රති අපනයන

4.අන්තරාල වෙළෙඳාම

- ප්‍රති අපනයන යනු කිසියම් රටකින් ආනයනය කරන ලද ද්‍රව්‍ය රට තුළට ගෙනැවිත් වෙනසකට භාජනය කර හෝ නොකර නැවත වෙනත් රටකට හෝ රටවලට යැවීමයි.මෙහි දී ආනයන අවස්ථාවේ දී ගෙවූ තීරු බදු අපනයනය කරන විට ආපසු අය කර ගත හැකි ය.
- විදේශ රටකින් ආනයනය කරන ලද ද්‍රව්‍ය රට තුළට නොගෙන වරාය තුළ නැවත සකසා හෝ සැකසීමකින් තොර ව නැවත වෙනත් රටකට හෝ රටවලට අපනයනය කිරීම අන්තරාල වෙළෙඳාම ලෙස හැඳින්වේ.

### අභ්‍යාස

1.රටකට විදේශ වෙළෙඳාමේ නිරතවීමෙන් අත්වන ප්‍රතිලාභ ලියා දක්වන්න.

2.විදේශ වෙළෙඳාමෙන් රටකට අවාසිදායක ප්‍රතිඵලවලට ද මුහුණ පෑමට සිදු වේ.මෙය සනාථ කිරීමට ඔබට ඉදිරිපත් කළ හැකි සාධක කවරේද?

එම්.ඒ.ඒ.අයි.ගුණවර්ධන මිය

ර/රත්නපුර ධර්මපාල මහා විද්‍යාලය